# බුදුදහමට සමීපවූ ජෛනාගම

අටබාගේ විමලඥාණ හිමි

ලෝකයේ පැවැති උසස් ආගම් අතුරෙන් එකකි ජෛනාගම. ඉන්දියාව ජන්ම භූමිය කරගත් ජෛනාගම බෞද්ධ, ක්‍රිස්තියානි ආගම් සේ විශාල ලෙස පැතිර ගියේය. මෙම ආගම ලක්වැසියන් තුළ පැතිර ගියේ නිගණ්ඨාගම නමිනි. නිගන්ථ නාමය පිළිකුල් කළයුතු නාමයක් නොවේ. එහි පැහැදිලි අදහස සුමංගල විලාසනියේ මෙසේ එයි. "අමහාකං ගන්ධන කිලෙසො පලිබුද්ධන කිලෙසො නත්ථි කිලෙස ගණ්ඨි රහිතා මයන්ති. එවං වාදිතාය ලද්ධනාම වසෙන නිගණ්ඨෝ"යි බාධා ඇති කරන කෙලෙස් ගැට අපට නොමැත්තේය යන අදහසින් නිගන්ථ නම් වීය. යනු එහි අදහසයි. ජෛනාගම ඉපැරැණි කලක සිට පැවැතෙන බවත් එය අන්තිම වරට වර්ධමාන මහාවීර හෙවත් නිගණ්ඨ නාථ පුත්‍ර විසින් ප්‍රකෘතිමත් කරනලද බව ජෛන ග්‍රන්ථ වලින් පෙනේ. ජෛනාගම කලින් කල ප්‍රතිසංස්කරණය කළ අය තීර්ථකර නමින් හඳුන්වන ලදී. නිගණ්ඨ නාථ පුත්‍රට ප්‍රථම එවැනි තීර්ථකරයෝ විසිතුන් දෙනෙක් ගැන සඳහන් වෙයි. මහා වීර විසිහතර වෙනි තීර්ථකරයා විය. බුදු දහමේ සූවිසි බුදුවරු හා සම්බන්ධ කථා මීට සමාන බවක් උසුලයි. ජින හෙවත් කෙලෙස් දිනූ තැනැත්තා යනු "තීතර්ථකර" යන්නට පර්යාය නාමයකි. ජෛන යන්න ජින යන්නෙන් සිද්ධ වූවකි. නිගණ්ඨ නාථ පුත්‍ර ක්ෂත්‍රිය කුලයෙහි ඉපිද තාපස ප්‍රවුජාව වැළඳ ගත්තෙකි. ගුරුවරයෙකු නොමැතිව සියලු ශාස්ත්‍රයන්හි පරතෙරට පැමිණි හෙතෙම තිස් අවුරුද්දක් ගිහි සැප වින්දේය. ශේතාම්බර නම් ජෛන නිකායට අනුව ඔහු විවාහ දිවියටද පත්ව සිටියේය. මෙසේ සිටින මහාවීර කුමරුට අවධි ඥාණය හෙවත් දිව්‍ය චක්ෂුසය පහලවිය. හෙතෙම පූර්ව ජාතිය ගැන සිතනුයේ සසර ගැන බියට පත්ව තමාට අයත් සියලු වස්තුව දන්දී ගිහිගෙයින් නික්ම තාපස බවට පත්වී දෙලොස් අවුරුද්දක් කෙලෙස් තවමින් වාසය කළේය. මේ කාලය තුළ සියලු වස්තු තෘෂ්ණාව දුරු කලහ. අන්තිම වශයෙන් ඇඟ දරා සිටි වස්ත්‍රයට පවා ආසාවක් නැතිව නිර්වස්ත්‍ර විය. තපසට පැමිණි හෙතෙමේ වෙසක් මස දසවක දින ශිජුකුල නම් ගං ඉවුරෙහි සල් ගසක් යට භාවනාවෙහි යෙදී සිටීමෙන් කේවල ඥාණය හෙවත් සියල්ල දන්නා නුවණ පහල විය. අනතුරුව ශක්‍රයාගේ ආරාධනය පරිදි තුසිත දිව්‍යරාජයා විසින් නිර්මිත ගන්ධකුටි නම් මානික්‍ය ආසනයෙහි හිඳ සියලු සත්ත්වයනට අර්ධමාගධී භාෂාවෙන් දහම් දෙසූහ. මෙසේ තිස් අවුරුද්දක් මුළුල්ලෙහි ධර්මය දේශනා කොට පංවා නුවරදී නිවන් දුටුහ.

ලෝකයේ පැවැති ආගම් අතර ජෛනාගමට හා බුද්ධාගමට අයත් ධර්මයන්හි බොහෝදුරට සමාන බවක් ඇත්තේය. සත්‍යය වශයෙන් බලනවිට බුද්ධාගමට ජෛනාගම තරම් සමීප වෙනත් ආගමක් නැත්තේය. මෙලොව හා පරලොව ගැලවීම යාග හෝම කිරීමෙන් හා බමුණන්ට සත්කාර කිරීමෙන් පමණක් ලැබෙන බව ජෛන හා බෞද්ධ මතය විය. තමාගේ ගැලවීම දෙවියෙකු මගින් නොව තමා විසින්ම ලබා ගතයුතු බව පළමුවෙන්ම දේශනා කොට ඇත්තේ බුද්ධාගමේ හා ජෛනාගමේය. ලොව මවන ඊශ්වරයෙකු ගැන විශ්වාසය නොකිරීමද මේ ආගම් දෙකේ පවත්නා තවත් සමාන කමී. ලොව දෙවියකු විසින් නොමවන ලද බවත් එය හේතු ප්‍රත්‍යයන්ගෙන් සිදුවන බවත් ජෛන මතය වීය. ජෛනාගමත් බුද්ධාගමත් අතර ඇති ප්‍රධාන වෙනසකට ඇත්තේ ආත්මය පිළිබඳ ඉගැන්වීමය. නාම රූප දෙක හැර මමය මගේ යයි කිවයුතු කිසිවක් නොමැති බවද එම ආගම් දෙකේ ඇති අන්‍යොන්‍ය සම්බන්ධය නිසා යාම් ඊම් ආදී ක්‍රියා පවතින බවද බෞද්ධ මතය වීය. ආත්ම දෘෂ්ටිය ජෛනාගමේ ප්‍රධානත්වයක් උසුලයි. සියලුදෙනාටම ආත්මයක් ඇතිබව එහි පිළිගැනීම විය. එම ආත්මය කිසිවකු විසින් ඇතිකළ හැකි හෝ නැතිකළ හැකි එකක් නොවේ. ආත්මයේ අතීත කෙලවරක් හෝ අනාගත කෙලවරක් නොමැතිය. එය සදකාලිකවූ වස්තුවකි. කෙනෙකුගේ ආත්මය තවත් අයකුගේ ආත්මයට වෙනස් නොවේ. කර්මයෙන් ආත්මය වැසී තිබෙනතුරු එහි සැබෑ තත්ත්වය ප්‍රකාශ නොවේ. කර්මයෙන් වෙන්වී ඉතා උසස් තත්ත්වයට පැමිණි ආත්මය පරමාත්මය විය. කර්මය නැති කිරීමට නම් ශක්තිමත්වූ තපසින් හා ඥාණයෙන් ද්‍රව්‍ය ගතිය ආත්මයෙන් වෙන්කළ කල්හි එම ආත්මය පරමාත්ම බවට පැමිණේ. සත්ත්වයා තම ආත්මය ද්‍රව්‍යයන්ගෙන් බැඳී පවතින තාක් දුක් විඳියි. මේ බැඳීම නිසා කර්මය හටගනී. කර්මය ඇතිතාක් ආත්මයට නිදහස් විය නොහැකිය. එම නිදහස ආත්මය ද්‍රව්‍යයෙන් නිදහස් කළවිට ලැබෙයි. මේ නිදහස තමන්ට මිස අන් අයෙකුට කළ නොහැකිය. ජෛනාගමේ එන එම කර්මය එකසිය පනස්අටවැදෑරුම් වේ. එය සංක්ෂේපයෙන් කොටස් අටකට මෙසේ බෙද දක්වමු.

1. ඥාණවර්ණීය කර්මය හෙවත් ඥාණය මුවහ කරණ කර්මය.
2. දර්ශනාවරණීය කර්මය හෙවත් ආත්මය අපිරිසිදු කරණ කර්මය.

3. වේදනීය කර්මය හෙවත් සත්ත්වයා තුල සැප දුක් ඇතිකරණ කර්මය.

4. මෝහනීය කර්මය හෙවත් යහපත අයහපත දෙකේ වෙනස අඟුරාලන කර්මය.

5. ආයු කර්මය හෙවත් යම් ආත්ම බවයක ආයු ප්‍රමාණය නියම කරණ කර්මය.

6. නාම කර්මය හෙවත් ශරීරාවයව ඇතිකරණ කර්මය.

7. ගෝත්‍ර කර්මය හෙවත් සත්ත්වයකු විසින් ඉපදීම ලැබියයුතු ජාති ගෝත්‍රාදී නියම කරණ කර්මය.

8. අන්තරාය කර්මය හෙවත් තමන් කැමැති කර්මයක් කිරීමට යාමේදී එය වලකන කර්මය

මෙකී කර්මය ඇතිවීමට හේතු හතරක් දක්වා තිබේ. එය නම්:

1. මිථ්‍යාව හෙවත් මුලාව.

2. අවිරතිය හෙවත් සංවරය නොමැතිකම.

3. කෂාය හෙවත් රාගය.

4. යෝග හෙවත් මුලින් කී තුනට අඩංගු නොවන කය, වචන, සිත යන තිදෙරින්වන ක්‍රියා ආදියයි.

මනුෂ්‍යයා කර්මයෙන් මිදුනු පසු සිඬ සංඛ්‍යාවට ඇතුලත් වෙයි. ඊට පසු ඔහුගේ ඥණය අනන්ත වෙයි. හෙතෙම මරණයෙන් මිදුන තැනැත්තෙක්ද වෙයි. නැවත ද්‍රව්‍ය ශරීරයත් ඔහුට අයත් නොවෙයි. මේ අවස්ථාවම නිර්මාණය - නිර්වාණය - මුක්තිය හෝ මොක්ෂය යයි කියනු ලැබේ. එහි මුලක් ඇතිමුත් අගක් නොමැතිය. ඒකාන්ත සුඛවූ මෙම අවස්ථාව ලබා ගැනීමට පිළිපැදිය යුතු මාර්ගය විස්තර සහිතව දක්වා තිබේ. පළමුකොට මෙම යහපත් මාර්ගයේ ගමන් කරන තැනැත්තා විසින් මුල් අවස්ථාවේදී ආරක්ෂා කළයුතු ප්‍රතිපත්ති විධි තිස් පහක් වෙති. එය මෙසේය:

1. මෝක්ෂය කරා ගෙනියන ප්‍රතිපත්තිය පුරන පළමුව නිවැරදි කර්මාන්තයේ යෙදීම.

2. ගිහියා සුදුසු අවස්ථාවෙහි තමාට ගැලපෙන තැනැත්තියක හා විවාහ වීම.

3. මත්පැන් බීම - දුකෙලිය - මාංශ භක්ෂනය වැනි දෙයින් පරිස්සම් වීම.

4. සදචාරයෙන් තමාට වඩා ගතිගුණඇත්තන් කෙරෙහි සතුටු වීම.

5. කම්සැප අනුභවයේදී සීමාසහිත වීම.

6. මානසික ශක්තිය දියුණු කරන්නා දුර්භික්ෂ භය රෝග භය - යුද්ධ භය ආදිය පවතින විසම තැන්වල නොවිසීම.

7. ජීවිතයත් වස්තුවත් රැකදෙන ආණ්ඩුවක් ඇති රටක විසීම.

8. යහපත් මග ගමන් කරන සත්පුරුෂයන් ඇසුරු කිරීම.

9. තමන්ට ගෙයක් සාද ගැනීමට අවශ්‍යවූ විට කෝලහල කරන අසල් වාසීන්ගෙන් තොරව එය සිදුකර ගැනීම.

10. තම ආදයමට සරිලන සේ ඇඳුම් ඇඳීම (වස්ත්‍ර සඳහා වැඩි වියදමක් නොකිරීම)

11. තමාගේ සෙසු වියදම් ආදායමට සරිලන පරිදි වීම.

12. යම් රටක වෙසේ නම් එරට චාරිත්‍රවලට විරුද්ධ නොවීම.

13. මාංශ භක්ෂනය සුරා පානය වැනි නොමනා චරිත දුරු කිරීම.

14. කිසිවකු සම්බන්ධව කේලාම් නොකීම.

15. පිරිසිදු ජීවිතය ඇති අය පමණක් ඇසුරු කිරීම.

16. අසත්පුරුෂ සේවනය නොකිරීම.

17. දෙමව්පියන්ට සත්කාර කිරීම.

18. කිසිවෙකුට රිදෙන පරිදි ක්‍රියා නොකිරීම.

19. තමා යටතේ සිටින්නන් මනාසේ පෝෂනය කිරීම.

20. ගුරුවරුනට, ආගන්තුකයනට හා අසරණ අයට ගරු සත්කාර කිරීම.

21. ප්‍රමාණය හා සුදුසු කල් බලා ආහාරය අනුභව කිරීම.

22. තම ශරීර ශක්තිය රැක ගැනීම.

23. සොර සතුරන් ගහන රටවල සංචාරය නොකිරීම.

24. අන්‍යයනට වෛර නොකර සියල්ලන් සමග සමාදනයෙන් විසීම.

25. තම ජීවිතය ආදර්ශයෙන් සපිරුන එකක් වීම.

26. ප්‍රමාණය ඉක්මවා කිසිවෙකු සමග භජනය නොකිරීම.

27. යහපත් ප්‍රතිපත්ති පුරන අයට ආධාර දීම.

28. ජීවිතය යම් අභිමතාර්ථයක් සඳහාම ගතකිරීම.

29. යම් වැඩකදී තමාගේ ප්‍රමාණය ගැන සිතීම.

30. නිතරම උසස් වීමට උත්සාහ ගැනීම.

31. කාලයට ගැලපෙන පරිදි කටයුතු කිරීම.

32. දිනපතා ආගමට අනුව ධර්මය කියවීම හා ධර්මය ඇසීම.

33. ස්ථබ්ධ ගතිය දුරුකිරීම

34. නිතර යහපත් ගුණවලට පක්ෂවීම.

35. තමා ඉදිරියේ ප්‍රකාශවන මත - දෘෂ්ටි - ආගම් ධර්මාදිය ගැන විමංශන බුද්ධියෙන් ක්‍රියා කිරීම.

තවද තරමක් දුරට හික්මුන තැනැත්තකු විසින් සමාදන් වියයුතු ව්‍රත දොළහක් ඇත. එය මෙසේ සඳහන් කරමු.

1. ස්ථූල ප්‍රානාතිපාත - විරමන ව්‍රතය හෙවත් ප්‍රාණඝාතයෙන් වෙන්වීමේ ව්‍රතය (ජෛන ධර්මයෙහි හැටියට ගස් කැපීම ද ප්‍රාණඝාතයකි. සසර වසනතුරු මේ ව්‍රතය අනුගමනය අපහසු බැවින් හැකි පමණ දුරට ගිහියා විසින් එය ඉටුකළ යුතුයි. නමුත් ආත්ම ආරක්ෂාව සඳහා යුද්ධ කිරීමට රජුට අවසර තිබේ.)

2. ස්ථූල මෘෂාවාද විරමන ව්‍රතය.

3. ස්ථූල අදත්තාදන විරමන ව්‍රතය.

4. ස්වදර සන්තෝෂ - පරදර විරමන ව්‍රතය.

5. ස්ථූල පරිග්‍රහ පරිමාන ව්‍රතය (නියමිත දෙයින් බැහැරැ දේ ප්‍රයෝජනයට නොගැනීම.)

6. භෝගෝපභෝග පරිමාන ව්‍රතය (අනර්ත කර්ම කිරීමෙන් වැලකීම.)

7. දිග් පරිමාන ව්‍රතය (යම සීමිත සීමාවක විසීම අන් අයද එහි යෙදවීම.)

8. අනර්ථ කර්ම විරමන ව්‍රතය (අනර්ථ කර්ම කිරීමෙන් වැලැකීම.)

9. සාමයික ව්‍රතය (පරමාත්මය ගැන සිතීමත් ධර්මය කියවීමත් මගින් සිතේ සාමය ඇතිකර ගැනීම.)

10. දිසාව කාසික ව්‍රතය (බොහෝ සෙයින් සීමා සහිත කරන ස්ථානයක විසීම.)

11. පෞසධොපවාස ව්‍රතය (නියම කරගත් කාලය තුළ ආහාර ගැනීමෙන් වෙන්වීමේ ව්‍රතය)

12. අර්ථති සම්විභාග ව්‍රතය (උපවාස දිනට පසුදින ජෛන ශ්‍රමනයෙකු කැඳවා දන් දීමේ ව්‍රතය)

මෙම ව්‍රතාදිය සමාදන්ව ඒවා ආරක්ෂා කිරීමෙන් ආත්මය කර්මයෙන් වෙන්කොට පරමාත්මභාවයට පමුනුවා ගන්නට හැකිය යනු ජෛන ධර්මයේ ඉගැන්වීමයි. ජෛන ධර්මයේ අඩංගු පුරාන පොත් වලට සිද්ධාන්ත හෙව ආගමයයි කියනු ලැබේ. එම පොත් අර්ධ මාගධී නම් ප්‍රාකෘත භාෂාවෙන් රචනාකොට තිබේ. මෙයට ජෛන ප්‍රාකෘත යයි ද කියනු ලැබේ. මෙම ප්‍රධාන පොත්පෙල හැරෙන්නට වෙනත් පොත් ලියා ඇත්තේ ජෛන මහාරාෂ්ට්‍රී නම් භාෂාවෙනි. ක්‍රි: ව: පළමු සතවර්ෂයේදී ජෛනාගම ශ්වේතාම්බර - දිගම්බර වශයෙන් කොටස් දෙකකට බෙදී තිබිනි. ශ්වේත වස්ත්‍ර දරන කොටස ශ්වේතාම්බර යයිද, දිසාව වස්ත්‍රය කොට නිර්වස්ත්‍රව සිටින පිරිස දිගම්බර නම් විය. ජෛනාගම කිසිකලෙකත් ලොව පැතිරගිය ආගමක් නොවීය. ජෛනාගම උසස් ධර්මයන්ගෙන් හෙබි ආගමකි.

මේ අනුව බුදු දහම කෙරෙහි පරිනත බුද්ධියක් ඇති උගත් බුද්ධිමතුනට බුදු දහමත් ජෛන දහමත් අතර ඇති සමීප සම්බන්ධතාවය මැනවින් වැටහෙනු ඇත.